# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

**⑥**

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

## 11 ශ්‍රේණිය

## ලාභ අරමුණු කර නොගත් සංවිධාන

1. ලාභ අරමුණු කර නොගත් සංවිධානයක් යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? උදාහරණ දෙන්න.
2. පුද්ගලයන් ලාභ අරමුණින් තොරව ව්‍යාපාර පවත්වාගෙන යාමට හේතු මොනවාද?
3. ලාභ අරමුණු කර නොගත් සංවිධාන විවිධ ක්‍රම මගින් ආදායම් රැස්කර ගනු ලබයි. එවැනි මාර්ග නම් කරන්න.
4. බොහෝ ලාභ අරමුණු කර නොගත් සංවිධාන විධිමත් ගිණුම් තැබීමක් සිදු කරයි. එසේ ගිණුම් තැබීමේ අරමුණු 4 ක් සඳහන් කරන්න.
5. ලාභ අරමුණු කර නොගත් සංවිධානයක පවත්වාගෙන යනු ලබන ප්‍රධාන ගිණුම් වර්ග දෙකක් දක්වන්න.
6. ලැබීම් ගෙවීම් ගිණුමක් යනුවෙන් අදහස් වන්නේ කුමක්ද ?
7. ලැබීම් ගෙවීම් ගිණුමක වාර්තා කරනු ලබන ලැබීම් වර්ග 10 ක් නම් කරන්න.
8. ලැබීම් ගෙවීම් ගිණුමක වාර්තා කරනු ලබන ගෙවීම් වර්ග 10 ක් නම් කරන්න.
9. ලැබීම් හා ගෙවීම් ගිණුම සමාන වන්නේ සාමාන්‍ය ව්‍යාපාර විසින් පිළියෙල කරනු ලබන කුමන ලේඛනයටද?
10. ලැබීම් ගෙවීම් ගිණුම පිළියෙල කිරීමේ අරමුණු 05 ක් දක්වන්න.
11. ලාභ අරමුණු කරනොගත් ව්‍යාපාර පිළියෙල කරනු ලබන ආදායම් ප්‍රකාශය යනු කුමක්ද?
12. ආදායම් ප්‍රකාශයක් පිළියෙල කිරීමේ අරමුණු කුමක්ද?
13. ඌනතාවය යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?
14. අතිරික්තය යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?
15. ලාභ අරමුණු කර නොගත් සංවිධාන පිළියෙල කරන ආදායම් ප්‍රකාශයත්, ලැබීම් ගෙවීම් ගිණුමත් අතර පවතින ප්‍රධාන වෙනස්කම් 5 ක් නම් කරන්න.
16. මුදල් පදනමට ලැබීම් ගෙවීම් ගිණුම පිළියෙල කිරීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?
17. උපචිත පදනමට ආදායම් ප්‍රකාශය පිළියෙල කිරීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?
18. ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයක ප්‍රධාන ආදායම් මාර්ගය කුමක්ද?
19. යාවජීව සාමාජික මුදල් යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?
20. ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයක සාමාජිකයන් ප්‍රමාණය හා වාර්ෂික සාමාජික මුදල දී ඇති විටෙක වාර්ෂික සාමාජික මුදල ගණනය කරන ආකාරය සමීකරණයක් ඇසුරින් පැහැදිලි කරන්න.

21. සරණ සුහසාධක සමිතියේ 2021 වර්ෂය තුළ සිදු වූ ලැබීම් හා ගෙවීම් තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| 2021/01/01 මුදල් ශේෂය | 80 000 |
| සාමාජික මුදල් ලැබීම් | 120 000 |
| බැංකු ණය ලැබීම් | 100 000 |
| ගොඩනැගිලි අරමුදලට පරිත්‍යාග | 60 000 |
| කොඩි විකිණීමෙන් ලද ආදායම | 40 000 |
| සඟරා විකුණුම් ලද ආදායම් | 30 000 |
| පරිත්‍යාග ලැබීම් | 60 000 |
| ප්‍රචාරණ වියදම් | 14 000 |
| විදුලිය | 2 000 |
| වරිපණම් | 1 000 |
| මුද්‍රණ වියදම් | 15 000 |
| පරිත්‍යාග ගෙවීම් | 18 000 |
| වැටුප් | 12 000 |
| ණය ගෙවීම් | 15 000 |

ඉහත තොරතුරු ඇසුරෙන් සරණ සුහසාධක සමිතියේ 2021 වර්ෂය සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුම පිළියෙල කරන්න.

22. දිලෙන තරු ක්‍රීඩා සමාජයේ 2021 වර්ෂය තුල සිදුවූ මුදල් ලැබීම් හා ගෙවීම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 2021/01/01 | මුදල් ශේෂය | 18 000 |
| | බැංකු ශේෂය | 12 000 |
| | පුවත්පත් විකුණුම් | 1 400 |
| | ක්‍රීඩාගාර නඩත්තු | 3 000 |
| | ගොඩනැගිලි කුලී | 6 500 |
| | ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම | 32 000 |
| | පුවත්පත් ගැනුම් | 7 300 |
| | වැටුප් | 11 000 |
| | පරිත්‍යාග ලැබීම් | 3 500 |
| | තැපැල් වියදම් | 1 400 |
| | ලිපිද්‍රව්‍ය | 2 000 |
| | ගොඩනැගිලි අළුත්වැඩියාව | 3 200 |
| | ක්‍රීඩාපිටි ඉදිකිරීම් | 15 000 |
| | සාමාජික මුදල් | 63 000 |
| | 2021/12/31 මුදල් ශේෂය | 10 000 |
| | බැංකු ශේෂය | ? |

ඔබ විසින් ඉහත ක්‍රීඩා සමාජයේ ලැබීම් හා ගෙවීම් ගිණුම පිළියෙල කර එදිනට බැංකු ශේෂය ගණනය කරන්න.



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

23. සත් සමුදුර ළමා සමාජයේ සාමාජික සංඛ්‍යාව 100 කි. එක් අයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 300 කි. 2020 වර්ෂය සඳහා ඔබට පහත සඳහන් තොරතුරු සපයා ඇත.

| | |
|---|---|
| ලිපිද්‍රව්‍ය මිලට ගැනීම් | රු. 2 000 |
| අන්තර්ජාල වියදම් | රු. 1 500 |
| සභරා විකුණුම් | රු. 10 000 |
| තැපැල් වියදම් | රු. 500 |
| ප්‍රවාහන ගාස්තු | රු. 1 800 |
| මුද්‍රණ වියදම් | රු. 4 000 |
| පරිත්‍යාග ලැබීම් | රු. 1 500 |

පහත අතිරේක තොරතුරු ද ඔබට සපයා ඇත.

(1) සාමාජිකයන් 90 දෙනෙකු සාමාජික ගාස්තු ගෙවා ඇත.
(2) වාර්ෂික වරිපනම් ගාස්තුව රු. 4 000 ක කාර්තු 3 ක වරිපනම් ගාස්තු ගෙවා ඇත.
(3) ගොඩනැගිලි කුලිය මසකට රු. 500 කි. එය සෑම මසකම පළමුදා ගෙවයි.

ඔබ විසින්,

I. ඉහත තොරතුරු පදනම් කරගෙන 2020 වර්ෂය සඳහා සත්සමුදුර ළමා සමාජයේ ලැබීම් හා ගෙවීම් ගිණුම පිළියෙල කරන්න.

24. පහත දැක්වෙන්නේ සිරිලක ක්‍රීඩා සමාජය 2021 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ලැබීම් හා ගෙවීම් ගිණුමයි.

සිරිලක ක්‍රීඩා සමාජය
2021/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ලැබීම් හා ගෙවීම් ගිණුම

| | | | |
|---|---|---|---|
| 21/01/01 ශේෂය මුදල් | 80 000 | පරිත්‍යාග ලැබීම් | 40 000 |
| සාමාජික ගාස්තු | 60 000 | ගොඩනැගිලි ඉදිකිරීම් | 20 000 |
| ක්‍රීඩා උපකරණ | 40 000 | වැටුප් | 10 000 |
| විදුලිබිල් | 6 000 | ජලබිල | 5 000 |
| සංග්‍රහ වියදම් | 4 000 | වරිපනම් | 4 000 |
| කොඩි විකුණුම් | 12 000 | මුද්‍රණ වියදම් | 6 000 |
| තරඟ වියදම් | 4 000 | තරඟ සංවිධාන ආදායම් | 18 000 |
| | | ශේෂය ප/ගෙ | 84 200 |
| | 206 000 | | 206 000 |

ඉහත ලැබීම් හා ගෙවීම් ගිණුමේ වැරදි ඇති බව අනාවරණය විය. නිවැරදි ලැබීම් හා ගෙවීම් ගිණුම පිළියෙල කරන්න.



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

25. "ජය ගන්නෝ දිනන්නෝ" ක්‍රීඩා සමාජයේ 2021 වර්ෂයට අදාළ පහත සඳහන් තොරතුරු ඔබට සපයා ඇත.

| | |
|---|---|
| වර්ෂය තුළ ලැබුණු සාමාජික මුදල් | රු. 10 000 |
| ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම | රු. 5 000 |
| පුවත්පත් මිලදී ගැනීම | රු. 500 |
| ලැබුණු පරිත්‍යාග | රු. 1 000 |
| ලියන මේසයක් මිලදී ගැනීම | රු. 3 000 |
| විදුලි බිල් | රු. 3 500 |
| ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම | රු. 2 000 |
| දුරකථන වියදම් | රු. 500 |
| ජල බිල | රු. 400 |
| සංග්‍රහ වියදම | රු. 2 000 |
| ප්‍රදර්ශන ආදායම් | රු. 20 000 |
| ප්‍රදර්ශන වියදම් | රු. 8 000 |
| තරඟ සංවිධාන ආදායම් | රු. 10 000 |
| තරඟ සංවිධාන වියදම් | රු. 4 000 |
| මුදල් ශේෂය | රු. 12 000 |
| පුස්තකාල අරමුදලට පරිත්‍යාග | රු. 50 000 |
| ක්‍රීඩාපිටිය පිළිසකර කිරීම | රු. 20 000 |

පහත අතිරේක තොරතුරු ඔබට සපයා ඇත.

1. ක්‍රීඩා සමිතියේ සාමාජිකයන් 150ක් සිටින අතර එක් අයෙකුගේ වාර්ෂික සාමාජික අදාල රු.100කි.
2. ගෙවිය යුතු විදුලිය රු.500 කි.
3. ඉතිරි වූ ලිපි ද්‍රව්‍යවල වටිනාකම රු.400 කි.

ඔබ විසින් "ජය ගන්නෝ දිනන්නෝ" ක්‍රීඩා සමාජයේ ආදායම් ප්‍රකාශය පිළියෙල කරන්න.

26. සපිරි පාඨක සමාජයේ සාමාජික සංඛ්‍යාව100 කි. එක් අයෙකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 500 කි. එහි භාණ්ඩාගාරික විසින් පිළියෙල කරන ලද ලැබීම් හා ගෙවීම් ගිණුම පහත දැක්වේ.

ලැබීම් හා ගෙවීම් ගිණුම

| | | | |
|---|---|---|---|
| 2021/1/1 | 40 000 | පොත් මිලදී ගැනීම් | 60 000 |
| සාමාජික මුදල් | 35 000 | ගොඩනැගිලි කුළී | 15 000 |
| සැණකෙලි ආදායම් | 70 000 | සැණකෙලි වියදම් | 20 000 |
| සහරා විකුණුම් | 30 000 | ලී බඩු ගැනුම් | 25 000 |
| පරිත්‍යාග | 60 000 | මුද්‍රණ වියදම් | 5 000 |
| | | ශේෂය ප/ගෙ | 110 000 |
| | 235 000 | | 235 000 |

පහත අමතර තොරතුරු ද සපයා ඇත.

1. සැණකෙලිය සඳහා දරණ ලද ප්‍රචාරණ වියදම් රු.5 000ක් තව දුරටත් ගෙවිය යුතු ඇත.
2. පාඨක සමාජය සතු ලී බඩු 5%කින් ක්ෂය කළ යුතුය.
3. ගෙවිය යුතු විදුලි ගාස්තු රු.1 000කි.

ඔබ විසින්, සපිරි පාඨක සාමාජයේ 2021/12/31 දිනෙන් අවසන් වසර සඳහා ආදායම් ප්‍රකාශය පිළියෙල කරන්න.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

27. "මල් කැකුළු" ක්‍රීඩා සමාජයේ පහත තොරතුරු ඔබට සපයා ඇත.

1) සමිතියේ සාමාජිකයන් 50ක් සිටින අතර එක් අයෙකුගේ සාමාජික මුදල රු.2 000කි.
2) 2021/1/1 දිනට සමිතිය තුළ රු.200 000ක ක්‍රීඩා උපකරණ පවතී.
3) 2021/1/1 දිනට බැංකු ණය වටිනාකම රු.120 000කි. බැංකු ණය සඳහා වාර්ෂික පොලිය 12%කි.

මෙම ක්‍රීඩා සමාජය 2021.12.31 දිනට පිළියෙල කළ ලැබීම් හා ගෙවීම් ගිණුම පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| 2021/1/1 ශේෂය | 100 000 | සැණකෙලි වියදම් | 120 000 |
| සාමාජික මුදල් | 80 000 | බැංකු ණය ගෙවීම් | 20 000 |
| පරිත්‍යාග | 60 000 | ක්‍රීඩා උපකරණ | 30 000 |
| ක්‍රීඩා අරමුදලට පරිත්‍යාග | 180 000 | විදුලි බිල | 5 000 |
| සැණකෙලි ආදායම් | 250 000 | වැටුප් | 40 000 |
| | | රක්ෂණ ගාස්තු | 10 000 |
| | | ක්‍රීඩා උපකරණ අළුත්වැඩියා | 3 000 |
| | | ප්‍රවාහන වියදම් | 8 000 |
| | | 12/31 ශේෂය ප/ගෙ | 434 000 |
| | 670 000 | | 670 000 |

පහත තොරතුරු ද ඔබට සපයා ඇත.

1) වර්ෂය අවසානයේ ක්‍රීඩා උපකරණවල වටිනාකම රු.220 000ක් විය.
2) ගෙවිය යුතු විදුලි ගාස්තුව රු.5 000කි.
3) ක්‍රීඩා පුහුණුකරුට රු.20 000ක දීමනාවක් ගෙවිය යුතුව ඇත.

ඔබ විසින් ඉහත ක්‍රීඩා සමාජයේ 2021.12.31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය පිළියෙල කරන්න.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ඒකකය